# මුල් ළමාවිය සුරැකීමෙහිලා රැක බලාගන්නන්ගේ දායකත්වය කෙරෙහි නාගරික ග්‍රාමීය හා වතුකරයේ සමාජ ස්ථර අතර පවත්නා විෂමතා පිළිබඳ අධ්‍යයනයක්

**N. W. විජ්ලා**

**B.Sc. (Peradeniya)**
**Diploma in Ed (Colombo)**
**Diploma in Special Ed. (NIE)**
**M.Ed. (Colombo)**

UCLIB
545641

University of Colombo
Library
Sri Lanka

කොළඹ විශ්ව විද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධය

ලියා පදිංචි අංකය – **2004/M.Phil/08**

## සාරාංශය

පුද්ගල ජීවිතයේ සමස්ත සංවර්ධනයෙහි පදනම සකස් වන්නාවූ, මුල්ළමාවිය ඉතා වැදගත් හා තීරණාත්මක අවධියක් ලෙස සැලකේ. එම අවධියේ හැඩගැස්ම, අනාගතයෙහි කෙබඳු පුද්ගලයකු බිහිවේද යන්න තීරණය කරයි. යුනෙස්කෝව ඇතුළු ළමයින් වෙනුවෙන් ක්‍රියාත්මක වන ජාත්‍යාන්තර සංවිධාන මුල්ළමාවිය, උපතේ සිට අවුරුදු අට දක්වා අවධිය ලෙස අර්ථ දක්වා ඇති අතර, ශ්‍රී ලංකාවේ 'මුල්ළමාවිය සුරැකීම හා සංවර්ධනය' ජාතික ප්‍රතිපත්තියට අනුව, එය අර්ථ දැක්වෙනුයේ පිළිසිඳ ගැනීමේ සිට අවුරුදු පහ සම්පූර්ණ වීම දක්වා අවධිය ලෙසටය.

මෙම අවධියේදී සිදුවන කායික හා මානසික සංවර්ධනය ධනාත්මක ලෙස සිදුවීමට නම්, මුල්ළමාවිය ගත කරන දරුවන්, සුරැකීම නිසි අයුරින් සිදුවිය යුතුය. මේ සඳහා සෘජු ලෙසම සම්බන්ධ වන්නේ, ඔවුන්ගේ රැක බලාගන්නන්ය. ළමා ප්‍රඥප්තිය යටතේ, ළමා අයිතිවාසිකම් හා සමාන වරප්‍රසාද පිළිබඳ අවධාරණය කොට තිබුන ද, ස්ථරගතව ඇති සමාජමය ව්‍යුහයක පවත්නා විවිධ විෂමතා මුල්ළමාවිය සුරැකීම කෙරෙහි ගැටලු මතු කරයි. මුල්ළමාවිය සුරැකීමේ ක්‍රියාවලිය, අනාගත ආයෝජනයක් වන බැවින්, සමාජ විෂමතා මත, ඒ පිළිබඳ ගැටලු මතුවීම, රටක ඉදිරි අපේක්ෂා කෙරෙහි ද, සෘජුවම බලපෑම් ඇති කරයි.

ශ්‍රී ලංකාවෙ සමාජ විෂමතා, අන්තර් දිස්ත්‍රික්ක වශයෙන් මෙන් ම දිස්ත්‍රික්ක ඇතුළත වශයෙන් ද, දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතරින් බදුල්ල දිස්ත්‍රික්කය ඇසුරු කොට ගනිමින්, මුල්ළමාවිය සුරැකීම කෙරෙහි රැක බලාගන්නන්ගේ දායකත්වයෙහි නාගරික, ග්‍රාමීය හා වතු යන සමාජ ස්ථරයන්හි පවත්නා විෂමතා පිළිබඳ සොයා බැලීම අද්‍යතන අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.

මුල්ළමාවිය හා සම්බන්ධ මෙතෙක් කර ඇති, දේශීය හා විදේශීය අධ්‍යයනයන්ගේ අනාවරණ මෙම අධ්‍යයනයට ද, අදාළ කර ගන්නා ලදි. එම බොහෝ අධ්‍යයන මධ්‍යස්ථාන පාදක අවස්ථා සඳහා යොමු වී තිබූ අතර, නිවාස පාදක අවස්ථා සඳහා නියැලුන අධ්‍යයන අඩුය.

පෙර සාහිත්‍ය විමර්ශනයට අනුව පොදු අරමුණු හතරක් ඔස්සේ අධ්‍යයනය සැලසුම් කරන ලදි. මුල්ළමාවිය සුරැකීමේ අවශ්‍යතාව සහ ඊට බලපාන සාධක පිළිබඳ විමසීම, සුරැකීමෙහිලා රැක බලාගන්නන්ගේ දායකත්වය පිළිබඳ විමසීම, සුරැකීමෙහිලා රැක බලාගන්නන්ගේ දායකත්වය කෙරෙහි, නාගරික, ග්‍රාමීය හා වතු සමාජ ස්ථර අතර පවත්නා විෂමතා පිළිබඳ විමසීම සහ මුල්ළමාවිය සුරැකීම සම්බන්ධ ගැටලු අවම කර ගැනීමේ විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ විමසා බැලීම, එම අරමුණු විය.

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා දත්ත ලබා ගැනීමට, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල, බණ්ඩාරවෙල හා හපුතලේ යන ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසවල නාගරික, ග්‍රාමීය හා වතු අංශයන්හි ග්‍රාම නිලධාරි වසම් තුළ, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස නවයක, මුල්ළමාවිය දරුවන් 90 ක් මාධ්‍ය කොට ගන්නා ලදි. ඒ අනුව, එම දරුවන් රැකබලාගන්නන්ගේ නියැදියක්, මුල්ළමාවිය සුරැකුම් හා සංවර්ධන මධ්‍යස්ථාන හා එම ගුරු නියැදියත් මුල්ළමාවිය සඳහා දායකත්වය දක්වන සම්පත් දායක නියැදියක් යොදා ගන්නා ලදි. විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමට, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකාච්ජා/ෂෙඩුල, නිරීක්ෂණ ෂෙඩුල සහ ගිල්ෆර්ඩ් කොටු දැල් ජාල ආකෘතිය යොදා ගැණිනි. දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්තාර, ප්‍රතිශත සහ 't' පරීක්ෂණය යොදා ගන්නා ලදි.

නිවාස පාදක අවස්ථා සඳහා, මුල්ළමාවිය සුරැකීමේ සාධක වන, කාලය, දැනුම, ආහාර සහ මනෝ සමාජයීය උත්තේජ යන සාධක සම්බන්ධව, නාගරික, ග්‍රාමීය හා වතු සමාජ ස්ථර අතර වෙසෙසි වෙනසක් ඇති අතර, සෞඛ්‍ය සහ සෞඛ්‍ය පුරුදු සම්බන්ධව වෙසෙසි වෙනසක් නොමැති බවත් 't' පරීක්ෂණයෙන් අනාවරණය විය.

මුල්ළමාවිය සුරැකුම් හා සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධ භෞතික පරිසරය, ඉගෙනුම් උපකරණ වාර්තා හා ලේඛන පිළිබඳ නාගරික, ග්‍රාමීය හා වතු සමාජ ස්ථර අතර විෂමතා පවතින බවත්, ගුරුවරුන්ගේ දායකත්වය කෙරෙහි බලපාන සාධක සහ ගුරු සිසු අන්තර් ක්‍රියා සම්බන්ධයෙන්, විෂමතා පවතින බවත් අනාවරණය විය..

මුල්ළමාවිය සුරැකීම සඳහා දායකත්වය දක්වන සම්පත් දායක ආයතන හා සංවිධාන, ග්‍රාමීය හා වතු අංශ කෙරෙහි පමණක් ක්‍රියාත්මක වීමත්, එම දායකත්වය අඛණ්ඩ වැඩ පිළිවෙලක් යටතේ මෙහෙයවීමක් නොමැති බව අනාවරණය විය. මුල්ළමාවිය සුරැකුම් හා සංවර්ධන මධ්‍යස්ථානවල භෞතික සම්පත්, මෙන්ම ගුරුවරුන්ගේ දායකත්වය කෙරෙහි බලපාන්නාවූ සාධකවල අඩු ප්‍රමිතියද, මුල්ළමාවිය දරුවන් සුරැකීමේ ගැටලු ලෙස පවතී.

ගැටලු අවම කර ගැනීම සඳහා මුල්ළමාවිය අධ්‍යාපනය සඳහා, ප්‍රමිතීන්ට අනුකූලව මානව හා භෞතික සම්පත් සැපයීමත්, මධ්‍යස්ථාන පාදක මෙන්ම නිවාස පාදක අවස්ථා සඳහා, රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික අංශ සහ රැක බලාගන්නන් ගේ වැඩි දායකත්වයක් ලබා දෙන්නාවූ අඛන්ඩ වැඩ පිළිවෙලක්, නාගරික, ග්‍රාමීය හා වතු සමාජ ස්ථර තුනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කෙරේ.

## ABSTRACT

Early childhood is considered as the most important and decisive period in forming the foundation of the holistic development of one's personal life. The type of ones future personality depends on how he or she brought up during this period. The Some international organizations engage in early childhood care and development activities including UNICEF have defined the period from birth to eight years as early childhood. But according to the national policy for early childhood care and development in Sri Lanka, this period is defined as the period from conception to the age of five years.

Proper childhood care is essential for positive physical and mental development of children in this age group. The caregivers of these children directly contribute and bare responsibility for the proper development. Although it has been emphasized under "the child ordinance," equal rights for children, and "early childhood care" is an investment for the future. The problems arising due to social differences affect the future prospects of the country.

In Sri Lanka such differences exist on district level as well as inter-district levels. The main purpose of this study is to assess the contribution of the caregivers in urban, rural and estate sector, in respect of early childhood care.

The finding of the home based and centre based studies carried out by foreign organizations in this field so far, have been used for this study. It was seen that most of these studies have been centre based (ie .pre-school). Home based studies are relatively less. These studies have shown the importance of early childhood care and the need for such care, the factors that necessitate such care and the contribution of caregivers. According to the literature surveyed relevant to the problem, this study has been planned to be conducted under four objectives .They are,

- Investigating the need for early childhood care and factors that influence such care.
- Investigating the contributions of caregivers in early childhood care and development.
- Investigating the social differences among urban, rural and estate social strata
- Investigating the alternatives to minimize the impact of problems relating to early childhood care.

In order to achieve these objectives, ninety children of nine divisional M.O.H. areas were selected from urban, rural and estate gramasevaka divisions, in three divisional secretariat areas in Badulla, Bandarawela and Haputale, for collection of data.

Accordingly, a sample of parents or caregivers of those children, a sample of early childhood care and development centers including the teachers attached to those centers and a sample of resource persons who contribute to childhood care and development were used for this study.

Under descriptive research methodology to collect information questionnaire and interview schedules, observation schedules and Guilford network frame were used. These data were analyzed and presented in tables, charts, graphs, percentage and "t" tests were computed.

It has been revealed by the "t" tests that, although in home based situations, there is a significant differences in the factors concerning early childhood care, such as Time, Knowledge, Food and Psycho social stimulation among urban, rural and estate groups, there is no such differences in respect of their health habits. When taking into

consideration centre based situations of early childhood care and developments centers, there are differences in physical environment, learning equipment, reports and registers, there are differences among urban, rural and estate sectors. The same factors affect the teacher too serve in the relevant areas.

It was revealed that donor organizations and institutions for early childhood care, very often confine themselves to rural and estate sectors. Intervention and activities of such organizations are not focused and organized around real problems related to early childhood development. Implementation period also depends on availability of funds rather than the need of the service .On real Problems related to early childhood development. Furthermore the poor standard of physical resources available at child care and development centers and the inadequately of teacher participation is also another existing problem. In order to minimize these existing problems, provisions of material needs according to stipulated standard are a must. For both home based and centre based situation, it is proposed to organize integral program, covering, urban, rural and estate sectors, government and non government organization, private sector and parent/caregiver participation.